ලංකා කලා මණ්ඩලය ඉදිරිපත් කළ

# කර්ණාට සංගීත

උත්තර භාරතීය ගායන ... අසන්නට ලැබෙතත් දකුණු ඉන්දියාවට විශේෂ කර්ණාට සංගීතය සිංහල අපට අසන්නට ලැබෙන්නේ කලාතුරෙකිනි. එබඳු විරළ අවස්ථාවක් පසුගිය 10 වැනිදා අපට ලබාදීම ගැන ලංකා කලා මණ්ඩලයේ සංගීත හා මුද්‍රා නාට්‍ය අනු මණ්ඩලයට සංගීතාභිලාෂීන්ගේ ස්තූතිය නොමදව හිමි වෙයි.

භූගෝලීය වශයෙන් දකුණු ඉන්දියාව අපට වඩා ළං වුවත් සංස්කෘතික වශයෙන් අපට ළං වන්නේ උතුරු ඉන්දියාවය. මුල්ම සිංහලයන් බටගිරින් වුව නැගෙනගිරින් වුව ආයේ උතුරු ඉන්දියාවේ සිට වීම නිසා එදා මෙදාතුර කාලයෙහි සිංහලයන් කෙරෙහි දක්නට ඇත්තේ උතුරු ඉන්දියානු බලපෑමයි. අපේම යැයි කිව හැකි දිසුණු දේශජ සංගීතයක් නැතැයි සැලකෙන නිසා සංගීත රසිකයන් ඇදෙන්නේ උත්තර භාරතීය සංගීතය කෙරෙහිය. රජයේ ලලිත කලායතනයෙහි ඉගැන්වෙන්නේ මේ උත්තර භාරතීය සංගීතයයි. ගුවන් විදුලියේ ශාස්ත්‍රීය අංශයෙන් ද කොතෙකුත් ඇසෙනුයේ උතුරු ඉන්දියානු ගායන හා වාදනයි. අපගේ සංස්කෘතික සම්බන්ධකම් කෙසේ වෙතත්, දක්ෂිණ භාරතීය කර්ණාට සංගීතය පොදු රසිකයා වෙත ගෙන ඒමට කිසිවකු තැත් නොකිරීම තේරුම් ගත නොහැක්කකි. දක්ෂිණ භාරතීය සංගීතය ශාස්ත්‍රීයත්වය අතින් ගත්තේ උත්තර භාරතීය සංගීතයට නොදෙවෙනි තැනකි.

## සංගීතය

ශාස්ත්‍රීය සංගීතය ප්‍රිය කරන රසිකයා හින්දුස්ථානී සංගීතය පමණක් නොව කර්ණාට සංගීත ද රස විඳිනු නො අනුමානය. උත්තර භාරතීය සංගීතය අප රට ජනප්‍රිය වෙන්නට ප්‍රථම මෙරට රසික හිත් ඇදගත්තේ දක්ෂිණ භාරතීය සංගීතය බව නාඩගම් සංගීතයෙන් පෙනේ. නාඩගම් රංගතාල රසිකයන් අතර ජන...

පැමිණ ගිරියේ අනලෝස්සක්. සාමාන්‍යයෙන් සංස්කෘතික සංදර්ශනයක දී දක්නට ලැබෙන මුහුණු වට දක්නට නොලැබීම විමතියට හේතුවක් විය. කර්ණාට සංගීතය කෙරෙහි දක්වන උදාසීනතාව දක්වන්නකි.

මෙහිලා අනු මණ්ඩලයට එක් යෝජනාවක් කරනු කැමැත්තෙමි. මහජනයාට මෙය පෙන්වීමට අදහස් කරන ලද්දේ මුදලකටය.

## මධුප

විසිනි

හේතුව කුමක් හෝ වේවා, එදින පැමිණි සංඛ්‍යාවෙන් පැහැදිළිවම පෙනීයන්නේ සිංහල සංගීතාභිලාෂියා කර්ණාට සංගීතය අගය නොකරන බවයි. දැන් පළමුව කළ යුතුව ඇත්තේ ඔවුන් එය අගය කරන පිරිසක් කිරීමයි, ඔවුන් ඒ කෙරෙහි අද්දැනීමයි. උගත් සහෘදයන් පිරිස වුව කර්ණාට සංගීතයෙන් උදම් වන්නේ ඔතරම් අඩුවෙන් නම්, පොදු රසිකයා එය කෙරෙහි දක්වන උනන්දුවේ තරම කොතෙක් දැයි සිතාගත හැකිය. මහජනයා ගෙන් මුදල් අය කොට දිය යුතු රසයකට වඩා දැනට එය මහජනයාට මුදලක් ද දී අගය කරවීමට සිදුවී ඇති රසයකි.

## මණ්ඩලයි

එහෙයින් මෙබඳු සංදර්ශන පැවැත්විය යුත්තේ නොමිලයේය. වෙකෝස්ලෝවේකියාවෙන් පැමිණි වජීත්තෝවා හා හැව්ලිකෝවා මැතිනියන් අතින් පුහුණුව ලැබූ ගෝලයන්ගේ හපන්කම් එළි කරන රූකඩ දර්ශනයක් මින් අවුරුද්දකට හමාරකට පෙර රාජකීය විද්‍යාලය ශාලාවේදී පෙන්වන ලද්දේ ආරාධිත අමුත්තන් ඉදිරියේය. එදා ශාලාව අතුරු සිදුරු නැති වෙන්නට පිරී තිබිණ. කලාත්මක බව අතින් තවමත් ඉතා පහත් තත්වයක පැවති අපේ රූකඩ නැටුම් බැලීමට එදා නො...

යැවීමෙන් ශාලාවෙන් අඩක් පමණ ප්‍රේක්ෂකයන් අපේක්ෂා කළ හැකිය. ඉතිරි භාගය අනාරාධකයෙන් එන පොදු රසිකයා ගෙන් පිරී යන ඇත. මුදල් අය නො කොට ප්‍රදර්ශනය කිරීමෙන් අනු මණ්ඩලයට වන පාඩුවක් නැත. එසෙත් ඉන් කලාකරුවනට සෙතක් ඇලැසෙනු ඇත. මුදල් අය කළ විට ආගේ පණස් දෙනෙකි. ඉනුත් වැඩි හරියක් ආරාධිත අමුත්තන්ය. ඉන් අනු මණ්ඩලය ලද ආදායමක් නොවීය, ගායකයන් හා නාට්‍යාංගනාවන් ලද අනුබලයක් ද නොවීය. මුදල් අය කරන්නට යෑම නිසා මුදලුත් නැති විය, අසා සිටින්නට අයත් නැති විය. ප්‍රේක්ෂාගාරය හිස්ව තිබෙනු දකින ගායකයා නිතැතින්ම දුර්මුඛ වීම වැළැකිය නොහේ.

## මහජනයා

මහජනයා ඉදිරියට එන කලාකරුවන් ස්ථානයේ ගෞරවය නොකෙලෙසන අයුරින් පැමිණ සිටීම රසිකයාට කලා රස විඳීමට වැඩි වැඩියෙන් අනුබල දීමකි. කර්ණාට ගායකයාත් ඔහුගේ සහායයට සිටි වාදකයනුත් කිසියම් පිළිවෙලකට ඇඳ සිටීම ඒ වැදගත්කම අවබෝධ කරගත් බව පෙන්වන්නකි. එක් වාදකයෙකු උඩුකය නොවසා පැමිණ සිටියාත්. එය ඔවුන්ගේ සංස්කෘතික අංගයකි. සහායක පිරිසේ වූ දසහැවිරිදි පමණ වූ බාලිකාව පවා ආවේණික ද්‍රවිඩ ඇඳුමින් සැරසී හිටිය ද පණිහාරතගේ දේශීය ගී ගායනයට සහාය වූ බාලිකාවන් තුන් දෙන යුරෝපා විලාසිතාවෙන් පාටින් සුන් කොට ගවුම් සැරසී සිටීම ප්‍රේක්ෂකයාගේ අවධානය ගායනය කෙරෙහිම යොමු කරන්නක් නොවීය. කොට ගවුම පාසලට, මහ මගට ඔබින්නේ වී මුත් සංස්කෘතික කටයුතු සඳහා නොහොබනක් බව පැහැදිළි වූ තව ද අවස්ථාවකි මේ. මෙහිලා අපගේ සිහියට නැගෙන්නේ කලකට පෙර වේදිකාගත වූ 'හෙළ මීහිර' ගායක වාද...